
**කුරු ගස් කලාව**

# කලාවත් ජීවිතයත් එක් කරන බොන්සායි



ප්‍රේමසිරි මහතා සිය ජයග්‍රාහී බොන්සායි නිර්මාණය සමඟ

"කුඩා දේ සුන්දරයි" (Small is beautiful) යනු ජනප්‍රිය කියමනකි. එහෙත් මෙම අපූරු නිර්මාණය සොබාදහමේ සුන්දරත්වය ද ඉක්මවා, අපූර්ව වූ අධ්‍යාත්මික සුවයක් ද ලබා දෙයි.

"බොන්සායි කලාව" එය හුදෙක් ම කලාවක් හෝ විනෝදාංශයක් ම නොවේ. ඒ තුළින් ලද හැකි මානසික සුවය ද අප්‍රමාණ ය.

කාර්යබහුල ජීවිතයෙන් මොහොතක් බොන්සායි පැළයක් දෙස බලා සිටීමට වැය කළ හැකි නම් මනස නිරවුල් කරවන සුළු වින්දනයක් ඒ තුළින් ලද හැකි වෙයි.

"බොන්සායි" යනු ජපන් වචන දෙකක එකතුවකි. "බොන්" - "Shallow tray" - "නොගැඹුරු බඳුන" සහ "සායි" - "a tree" - "පැළෑටිය" යනු එහි අර්ථය යි. එහෙත්, මෙකී අර්ථය ඉක්මවා යන යමක් එකී නිර්මාණය තුළ අන්තර්ගත වෙයි.

චීනය සහ ජපානය බොන්සායි කලාවේ නිජබිම් ලෙස සැලකේ. එදා සිට අද දක්වා ම ඔවුහු මෙම කලාව ආගමක් මෙන් අදහති.

ශ්‍රී ලංකාවට මෙය ආගන්තුක වුවත්, පසුගිය දිනෙක කොළඹ කලාභවනේ දී ශ්‍රී ලංකා බොන්සායි සංගමයේ සාමාජිකාවන් ගේ අපූරු බොන්සායි නිර්මාණ එකතුවක් අපට දැක ගන්නට ලැබිණි.

තරඟකාරී ස්වරූපයෙන් පැවති මෙම ප්‍රදර්ශනයේ සියලු අංශයන්ගෙන් ප්‍රථම ස්ථානය හිමි වූයේ බොන්සායි සංගමයේ වත්මන් සභාපති එම්. ඒ. ප්‍රේමසිරි මහතාගේ නිර්මාණයට ය.

මෙහිදී බොන්සායි නිර්මාණකරණය ඔහු දකින ආකාරය පිළිබඳව අපි විමසිලිමත් වීමු.

ගසක් යනු සොබාදහමේ දායාදයක්. එහි හැඩය, ප්‍රමාණය හෝ ආකාරය තීරණය වන්නේ සොබාදහමෙන් ම යි. කාලගුණ රටාව, අනෙකුත් ගස් හා ඇති තරඟකාරීත්වය වැනි සාධක මත මේවායෙ හි යම් යම් වෙනස්කම් සිදුවෙනවා.

බොන්සායි නිර්මාණයක දී සිදුවන්නේ සොබාදහමෙ හි ඇති ශාක පිළිබඳ මනා ලෙස අවබෝධ කර ගනිමින් ස්වභාවිකත්වය නොනසා එම ගස ම කුඩා ප්‍රමාණයෙන් සකසා ගැනීම යි. මෙහි විවිධාකාර රටා තිබෙනවා.

බොන්සායි නිර්මාණ හැදෑරීමෙන් සහ ඒවා පිළිබඳ ස්වයං අවබෝධයක් ලබා ගැනීම තුළින් ඕනෑ ම අයකුට තමාට ආවේණික වූ "රටාවක්" ගොඩ නගා ගැනීමට පුළුවන්. එක් බොන්සායි පැළයක් නිමැවීමට දරන වෑයම අලංකාර උසස් නිමැවුම් පැළ රැසක් සඳහා දරන වෙහෙස තරමට ම තෘප්තිමත්. එහෙත් ඒ සඳහා හොඳ නිමැවුම්කරුවකු වගේම පැළ ආරක්ෂකයකු වීම ද අත්‍යවශ්‍ය යි.



බොන්සායි පැළයක් රැක බලා ගැනීම දරුවකු රැක බලා ගන්නා ආකාරයට ම පරෙස්සමින් වගේ ම උනන්දුවෙන් කළ යුතු යි. පැළයේ සෑම අත්තක් ම, පොහොට්ටුවක් ම, ඒවායේ වර්ධනයේ සිදු විය යුතු වෙනස්කම් ඔබේ මනස මෙහෙයවා සිදු කළ යුතු යි.

පෝච්චියක වගා කළ විසිතුරු මල් පැළයක් සහ බොන්සායි පැළයක් අතර විශාල වෙනසක් තිබෙනවා. බොන්සායි යනු 10% පමණක් පැළයක්. එහි අනෙක් 90% ම කලාවක්. එහෙත් මේ කලාවේ අතිශයින් ම සුන්දර බව රැඳී ඇත්තේ අර 10% තරම් වන පැළය තුළ යි. එය කිසිදු නිම වන කලාවක් නොවෙයි. කාලයත් සමග එය වෙනස්කම්වලට ලක් වෙමින් අපත් සමග වැඩෙනවා. වයසට යනවා. එකම වෙනස වයසත් සමග දිරාපත් වනවා වෙනුවට වඩාත් අලංකාරව වැඩීම යි. එහි ඇති අපූර්වත්වය එය යි.

මා තුළ බොන්සායි කලාව පිළිබඳ උනන්දුවක් ඇති වුණේ ජපන් සංචාරයක දී ලැබූ අත්දැකීම් නිසා යි. ජපානයේ බැලූ බැලූ සෑම අතක ම ලොකු ගසක් කුඩා කිරීමේ සංකල්පය තිබෙනවා. උද්‍යානවල ඇති විශාල ගස් පවා ඔවුන් බොන්සායි කලාවට අනුව වෙනස් කර ඇති බවත් පෙනෙනවා.

ඒ අනුව 1995 දී මා බොන්සායි නිර්මාණය පටන් ගත්තා. මා දුටු දෙයට වඩා නියම තෘප්තියක් ලැබුණේ එය මා විසින් ම කිරීමට පටන්ගත් පසුව යි. මේ සඳහා විශාල ඉවසීමක් ඕනෑ.






**බොන්සායි ප්‍රදර්ශනයෙන්....**

මොකද, නිර්මාණයෙහි මූලික සැලකිල්ල හැඩුවට එය තමාට උවමනා ආකාරයට සකස් වීම අවුරුදු දෙක තුනක් ගතවනවා. මෙය ඉක්මන් කිරීමට යාමෙන් ගස මැරී යාමට පුළුවන්.

හුඟ දෙනෙක් මේ හේතුව නිසා ම මේ කාර්යයට අත ගසන්නේ නැහැ. ඒත් ඉවසීමෙන් බලා සිටියොත් ලැබෙන ප්‍රතිඵලය මිල කරන්න බැහැ.

බොන්සායි පැළයක් නියමාකාරයෙන් සකස් කර ගැනීම වියදම් දැරිය යුතු දෙයක් වුවත්, එය අඩු වියදමකින් කළ හැකි ක්‍රම අපට ම සකස් කර ගන්නන පුළුවන්. සාමාන්‍යයෙන් අතින් සැදූ බොන්සායි බඳුනක් මිල වැඩි නිසා ඒ වෙනුවට අඩු මිල සිමෙන්ති බඳුන් සාදවා ගත හැකියි.

ඒ වගේම බොන්සායි ගසේ විවිධ වර්ධන අවස්ථාවලට හැඩ සකස් කිරීමට උවමනා ඒ වෙනුවෙන් ම සකස් කළ මිල අධික උපකරණ අපට අත්‍යවශ්‍ය ම නැහැ. ඒ වෙනුවට අපට ලබා ගැනීමට පහසු සාමාන්‍ය උපකරණ යොදගෙන තමන්ට ම ආවේණික රටාවක් සකස් කර ගතහොත් තෘප්තියක් ලැබීමට එය ප්‍රමාණවත්.

මෙහිදී ප්‍රධාන ම අවශ්‍යතාව බොන්සායි පැළයක් සකස් කිරීමේ මූලික දැනුම යි. අප තෝරා ගන්නා පැළයට ගැළපෙන ප්‍රමාණයෙන් බඳුනක් තොරා ගැනීමේ සිට ගසේ වර්ධනයත් සමග කළ යුතු වෙනස්කම් ද දැන ගැනීම අවශ්‍ය යි.

බොන්සායි පැළයේ වර්ධනයට හිරුඑළිය ඉතා හොඳින් තිබිය යුතු යි. ඒ නිසා දින දෙකකට වඩා නිවස ඇතුළත තබන්න බැහැ. දිනකට දෙවරක් වතුර දැමීම නිසි වේලාවට පොහොර දැමීම ද වැදගත්. වැඩෙන ගසෙහි වෙනස්කම් කළ යුත්තේ අත් හුරුවෙන්ම යි. හැඩය වෙනස් කිරීමට කම්බි එතීම ද අතු නොකැඩෙන පරිදි පරෙස්සමින් නියමිත රටාවට කළ යුතු ය.

කුඩා බඳුනක පැළය වැඩෙන නිසා කලක් ගතවීමේ දී එහි මුල් වැඩී බඳුන තුළ සිරවීමක් සිදුවනවා. කොපමණ පොහොර දැම්මත් ගස නොවැඩීම, මල් කොළ කහපාට වීම වැනි ලක්ෂණ වලින් ඒ බව හඳුනා ගන්න පුළුවන්. එවිට පැළය ගලවා අනවශ්‍ය මුල් කපා දමා මුලින් කළ ආකාරයට ම පස් මිශ්‍රණය දමා නැවත සිටුවිය යුතුයි. අනවශ්‍ය මුල් කපා දැමූවට පැළය මැරෙන්නේ නැහැ.

මේ ආකාරයට බොන්සායි පැළයක් වැඩි වියදමක් නැතිව සකස් කරගත්තත් ඒ සඳහා වැඩි අවධානයක් යෙදවීම අත්‍යවශ්‍ය යි.

ජපානය වැනි රටවල බොන්සායි කලාව ආදායම් මාර්ගයක් වශයෙන් සිදු කළත්, අපේ රටේ එසේ කිරීම අපහසු යි. බොන්සායි පැළයක් වෙනුවෙන් වැය වන මහන්සිය, කැපවීම සහ කාලය බැලූ විට එයට මිලක් නියම කිරීම අපහසු යි. මිල නියම කළත් එය ඉතා ඉහළ මිලක් විය යුතු යි. මේ නිසා මේ සඳහා හොඳ ඉල්ලුමක් අපේ රට තුළ ඇති කිරීම අපහසු විය හැකි යි.

ශ්‍රී ලංකා බොන්සායි සංගමයේ සාමාජික සාමාජිකාවන් මසකට වරක් රැස් වී තමන්ගේ පැළ පිළිබඳ, ඒවායේ අඩුපාඩුකම් පිළිබඳ සාකච්ඡා කර දැනුම බෙදා ගන්නවා. මේ පිළිබඳ කැමැත්තක් ඇති ඕනෑම අයකුට එහි සාමාජිකත්වය ලබා ගැනීමට පුළුවන්.

(සාමාජිකත්වය ලබාගැනීමට ඇමතිය හැකි දුරකථන අංක 448565-සභාපති, 074-718248-ලේකම්)

කොහොම වුණත් බොන්සායි කලාව අත්හදා බැලිය හැක්කේ ඔබ සොබාදහම සමග සහයෝගයෙන් කටයුතු කරන්නෙක් නම් පමණ යි.

❑

**සටහන - ලලනි**

**ඡායාරූප - රේණුකා අල්විස්**

බොන්සායි බඳුනක් තෝරා ගැනීමේදී එය ඔබ තෝරා ගන්නා ගසේ පරිමාවට ගැලපෙන පරිමාවකින් තෝරා ගත යුතුයි. තෝරාගත් ගස උස ගසක් නම් ගසේ උස : පෝච්චියේ පළල = 3 : 2 අනුපාතයෙන් ද අතු විහිදුණු ගසක නම් පෝච්චිය ගසේ පළලට වඩා මඳක් අඩු පළලකින් ද විය යුතු ය. බොන්සායි පෝච්චියේ උස අඟල් 2 පමණ සිට ඉහළට විවිධ හැඩයෙන් ගසේ හැඩයට ගැලපෙන රටාවකින් තෝරා ගත හැකි යි. අපට වටාපිටාවේ හමුවන බොහොමයක් පැළ (නුග, අඹ, දෙහි කුලයේ ශාක, බෝගන්විලා, අන්දර , බෝ ආදී ) බොන්සායි පැළයක් ලෙස සැකසීමට පුළුවන්. බොන්සායි පැළයක් සිටුවීමේ දී පස් කැට ප්‍රමාණ 4 කින් තට්ටු වශයෙන් බඳුන තුළ අතුරා ගත යුතුයි. ගඟේ වැලි, හොඳින් වියළි ගොම, රතු පස්, දැව අඟුරු නියමිත අනුපාතයන්ගෙන් මේ පස් මිශ්‍රණයට එකතු කෙරෙනවා.

පැළය සිටුවීමේදී මුදුන් මුල කපා දමනවා. පැළය වැඩීමට මුදුන් මුල අවශ්‍ය වන්නේ නැහැ. කාලයත් සමග පැළය වැඩී පෝච්චිය තුළ මුල් සිර වී පැළයේ වැඩීම බාල වන බව පෙනී ගිය විට පැළය ගලවා අනවශ්‍ය මුල් යැයි හැඟෙන ඒවා කපා දමා ගසහි ප්‍රමාණයට ගැලපෙන ලෙස පෝච්චිය ද මාරු කර නැවත සිටුවිය යුතුයි. වැඩෙන ගසෙහි අතුවල හැඩ වෙනස් කරන්නේ කම්බි එතීමෙන්. මේ සඳහා ඇලුමිනියම් කම්බි සුදුසුයි. (රූප සටහන බලන්න) කම්බි එතීමට පෙර දිනක් පමණ ගසට ජලය නොයෙදීමෙන් අතු නවා ගැනීම පහසු වනවා.

